# ULA AS 2014 – 09

## ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා අනුරාධපුර යුගයේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ අධ්‍යයනයක්

**අනුෂා සජීවනී රුබසිංහ[1] සහ ගීතාංජලී සමන් දොළගේ[2]**
[1]ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය sajeewanie@kln.ac.lk
[2]ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය

ග්‍රන්ථ ප්‍රකාශනය යනුවෙන් අදහස් කරන්නේ අත් පිටපතක් ලිවීමේ කාර්යයේ සිට එය අවසන් උපයෝජකයාගේ භාවිතය සඳහා වන සියලුම ක්‍රියාවලීන්හි ප්‍රතිඵලය වේ. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය වර්තමානය වන විට හුදු වාණිජමය කටයුත්තක් වශයෙන් ක්‍රියාත්මක වුවද අතීතය පිළිබඳව විමසිලිමත්වීමේදී පැහැදිලි වන්නේ එය හුදෙක්ම සමාජයේ යහපත උදෙසා වාණිජමය පරමාර්ථයෙන් තොරව ක්‍රියාත්මක වූවක් බවයි.
මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වන්නේ ත්‍රිපිටකය මුඛ භාෂිතයෙන් ආරක්ෂා කර ගෙන ආ සංවිධාන ව්‍යුහය පිළිබඳව අධ්‍යයනය කිරීම, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම පිළිබඳව හා අනුරාධපුර යුගයේ ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳව අධ්‍යයනය කිරීමයි.
ඓතිහාසික මූලාශ්‍ර හා වෙනත් ද්විතියික මූලාශ්‍ර භාවිතයෙන් පර්යේෂණයට අදාළ දත්ත රැස් කරන ලද අතර ඓතිහාසික විශ්ලේෂණ විධික්‍රමයෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.
පර්යේෂණයෙන් බැස ගන්නා ලද නිගමනයන් මෙසේය. අනුරාධපුර යුගයේ ප්‍රකාශන කර්මාන්තයේ මුල් බීජ දක්නට ලැබෙන්නේ මුඛ පරම්පරා ගත ඥාන සම්ප්‍රේෂය තුළය. එහෙත් පැවති මුඛභාෂිත ක්‍රමය වෙනුවට ස්ථිරසාර පදනමක් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් සමඟින් ඇති විය. එමෙන්ම මෙරට අත්පිටපත් ග්‍රන්ථ ප්‍රකාශනය සිදු වූයේ පුස්කොළ ලේඛන කලාවක් මඟිනි. සිංහල අට්ඨකතා පාලියට පෙරලීම අනුරාධපුර යුගයේ ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයේ වැදගත් අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.ග්‍රන්ථ රචකයා බොහෝවිට ධර්මධරයෝ වූහ.ඔවුන්ගේ අත්පිටපත් සෙසු පිටපත්කරුවන් විසින් පිටපත් කොට දිවයින පුරා බෙදා හරින ලදී. මේ කාර්යය සඳහා රාජ රාජ මහාමාත්‍යාදීන් මෙන්ම අවශේෂ පොදු ජනතාව විසින් අනුග්‍රහය සපයන ලදී. පිටපත්කරුවන් විසින් සිදු කරන ලද්දේ වර්තමාන මුද්‍රණකරුවන්ට සමාන කාර්යයකි. අනුග්‍රාහකයන්ගේ කාර්යය වත්මන් ප්‍රකාශකයන්ගේ කාර්යයට සමාන විය. ලේඛන පිටපත්කරණය බෙදාහැරීම යන ප්‍රකාශනයට අදාළ මූලික ලක්ෂණ මෙරට අතීත ග්‍රන්ථ සම්ප්‍රදාය තුළද දක්නට ඇති බව මේ පර්යේෂණයේදී තහවුරු විය.

**මුඛ්‍යපද : ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, ග්‍රන්ථ ප්‍රකාශනය, අනුරාධපුර යුගයේ ඉතිහාසය**